

දැන් ඔබේ දුරකතනයේ Easypay App එක සඳහා ප්‍රවේශ වීමට PIN අංකයක් ලබාදීමට අවශ්‍යයි. පළමුව ඔබ විසින් PIN අංකයක් ලබාදෙන්න දෙවනුව නැවත එම අංකයම ලබා දෙමින් එය තහවුරු කරන්න.

මීළඟට ඔබේ දුරකතනයේ Fingerprint  මගින් හෝ Face ID මගින් Unlock කිරීමේ පහසුකම් තිබේනම්, එය Easypay App එක සඳහාද Activate කරගන්න.




**දැන් ලියාපදිංචි වීමේ ඔබේ කොටස අවසානයි. ඉතා ඉක්මනින් ඔබේ ලියාපදිංචිය තහවුරු කෙරෙනු ඇත.**


එතෙක් ඔබට ඒ බව මෙසේ App එකෙහි සඳහන් කෙරෙනු ඇත.




**ඔබේ ලියාපදිංචිය සම්පූර්ණ වූ පසු, ඔබට මෙවැනි තිරයක් දිස් වෙනු ඇත. එහිදී,**

මෙමගින් ඔබගේ බැංකු ගිණුමට ලබා ගැනීමට ඇති මුදල් ප්‍රමාණය බලාගත හැකිය. මෙම මුදල් ඔබගේ බැංකු ගිණුමට බැර කිරීම දිනකට වරක් ස්වයංක්‍රීයව සිදුවනු ඇත

මෙමගින් ඔබට ලැබුනු QR ගෙවීම් බලාගත හැකිය.




මෙහි ප්‍රධාන QR වර්ග දෙකක් ඇත

- **My QR**

මෙමගින් ඔබගේ ව්‍යාපාරයට අදාල QR එක ලබා ගැනීමට හැකිය. මෙය මුද්‍රණය කර ඔබේ ව්‍යාපාර ස්ථානයේ මුදල් කවුන්ටරය අසල තැබීමෙන් පාරිභෝගිකයන්ට මෙය scan කර QR ගෙවීමක් සිදුකළ හැකිය.

- **Generate QR**

මෙමගින් ඔබට නිශ්චිත මුදල් ප්‍රමාණයක් සඳහා QR එකක් නිර්මාණය කළ හැකිය. එය scan කිරීමෙන් පාරිභෝගිකයාට ඔබ සටහන් කළ මුදල ගෙවිය හැකිය.

මෙම වර්ග දෙකම ඔබට අවශ්‍යනම් තවකෙකුට යැවිය හැකිය. එවිට ඒ අදාල කෙනා ඔබ සමීපයේ නොසිටියත් ඔබ යවන QR එක scan කිරීමෙන් මුදල් ගෙවීම සිදුකළ හැකිය.




easypay.lk

# Easypay

POWERED BY

SEYLAN

# Merchant Guide Book

## ව්‍යාපාර හිමිකරුවන් සඳහා වූ අත්පොත

**මෙම QR එක Scan කර ඔබට මෙම ලියාපදිංචි වීමේ පියවර එකිනෙක අඩංගු වීඩියෝව නැරඹිය හැකිය.**



මෙම ලියාපදිංචි වීම අතරතුර ඔබ විසින් ලබා දිය යුතු ඡායාරූප සහ දත්ත කිහිපයක් ඇත. එම නිසා ලියාපදිංචිය ආරම්භ කිරීමට පෙර මෙම ඡායාරූප ඔබේ දුරකතනයේ ගැලරි එකට එක් කරගන්න, දත්ත සටහන් කරගන්න.

- **ජාතික හැඳුනුම්පතෙහි ඉදිරිපස ඡායාරූපයක්.**
- **ජාතික හැඳුනුම්පතෙහි පිටුපස ඡායාරූපයක්.**

(ජාතික හැඳුනුම්පත වෙනුවට රියදුරු බලපත්‍රය හෝ ගමන් බලපත්‍රය වුවද වලංගු වේ)


- **ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය.**
- **ව්‍යාපාරයේ ලියාපදිංචි සහතිකයේ ඡායාරූපයක්.**
- **ඔබේ ව්‍යාපාරයේ ඡායාරූපයක්.**

(ඔබේ ව්‍යාපාරය ලියාපදිංචි නොකළ ව්‍යාපාරයක් නම්, ඔබේ ව්‍යාපාරයේ ඡායාරූපය පමණක් ප්‍රමාණවත් වේ)

- **ඔබට මුදල් ලබා ගැනීමට අවශ්‍ය බැංකු ගිණුමෙහි, ඔබේ අනන්‍යතාව සහතික කළ හැකි පාස් පොතෙහි හෝ ගිණුමේ අයිතිය තහවුරු කරමින් බැංකුව විසින් නිකුත් කළ ලිපියක හෝ මුදල් හුවමාරු රිසිට් පතක ඡායාරූපයක්.**


GET IN ON Google Play

Download on the App Store




මෙම QR එක Scan කර Easypay Business App එක ඔබේ දුරකතනයට බාගත කරගන්න.

01.





02.




01.
ඔබේ දුරකතන අංකය ලබා දී **Continue** කරන්න.
(ආරම්භයේ ඇති 0 නොමැතිව ඉතිරි ඉලක්කම් නවය ඇතුල් කරන්න)

02.
ඔබ ඇතුලත් කළ දුරකතන අංකයට ලැබෙන **OTP** අංකය ලබා දෙන්න.


## දැන් ඔබේ දත්ත ලබාදීම සිදු කරන්න.




- නම
- විද්‍යුත් තැපැල් (Email) ලිපිනය
- ජාතික හැඳුනුම්පත් අංකය
- ජාතික හැඳුනුම්පතෙහි ඉදිරිපස ඡායාරූපයක්
  (ඔබ පෙර සූදානම් කරගත් ඡායාරූපය Gallery එකෙන් තෝරාගන්න)
- ජාතික හැඳුනුම්පතෙහි පිටුපස ඡායාරූපයක්
  (ඔබ පෙර සූදානම් කරගත් ඡායාරූපය Gallery එකෙන් තෝරාගන්න)


**මෙම දත්ත ලබා දී Continue කරන්න**

## දැන් ඔබේ ව්‍යාපාරය පිළිබඳව දත්ත ලබාදීම සිදු කරන්න.




- ඔබේ ව්‍යාපාරයේ නම
- ව්‍යාපාරයේ වර්ගය තෝරන්න
- ව්‍යාපාරය අයත්වන කාණ්ඩය තෝරන්න
- ව්‍යාපාරය අයත්වන උප කාණ්ඩය තෝරන්න
- ඔබේ ව්‍යාපාරයේ ස්වභාවය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න
- ව්‍යාපාර ලියාපදිංචි අංකය
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ ඡායාරූපයක්
- ඔබේ ව්‍යාපාරයේ ඡායාරූපයක්
  (ඔබේ ව්‍යාපාරය ලියාපදිංචි නොකළ ව්‍යාපාරයක් නම්, ඔබේ ව්‍යාපාරයේ ඡායාරූපය පමණක් ප්‍රමාණවත් වේ)
- ව්‍යාපාරය සඳහා වන ලිපිනය
- නගරය • පළාත • තැපැල් අංකය
- ව්‍යාපාරය සඳහා වන දුරකතන අංකය
- ව්‍යාපාරයේ විද්‍යුත් තැපැල් ලිපිනය

## දැන් ඔබගේ ගෙවීම් බැර කළ යුතු බැංකු ගිණුමෙහි තොරතුරු ලබා දෙන්න




- ගිණුමේ නම
- ගිණුම් අංකය
- ඔබේ බැංකු ගිණුමේ අයිතිය තහවුරු කළ හැකි ඡායාරූපයක්
  (ඔබ පෙර සූදානම් කරගත් ඡායාරූපය Gallery එකෙන් තෝරාගන්න)
- බැංකුවේ නම
- ශාඛාව

**මෙම දත්ත ලබා දී Continue කරන්න**